සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙහිඕවිට අධ්‍යාපන කලාපය.

# මව්බස විෂය සමගාමී ක්‍රියාකාරකම්

සැකසුම : කේ. ජී අශෝකා මැණිකේ (ගුරු උපදේශක)

---

## 2 ශ්‍රේණිය

### ක්‍රියාකාරකම - 1

**(යොමු කිරීම සඳහා උදවු අවශ්‍යයි )**

- හිමිදිරි උදයේ හෝ හවස අඳුරු වැටීගෙන එන වෙලාවෙන් පහසු වේලාවක් තෝරාගන්න (6.00 – 6.30 අතර කාලය නම් වඩාත් හොඳයි).
- විනාඩි දහයක් දෑස් පියාගෙන අවටින් ඇසෙන ශබ්දවලට සවන් දීමට යොමු කරන්න.
- ඇසුණු ශබ්ද මොනවාද? අසන්න. නිදහසේ ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දෙන්න.
- ඇසුණු ශබ්ද අනුකරණය කරන්න.
- සතිය අවසාන දිනයේදී ඇසුණු ශබ්ද ඇසුරින් කැමතිම ශබ්ද අනුකරණය කරන්න.